# "නැවිරු සවිය" (නාවික සුවසහන අරමුදල) අටවන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව- 2013

1. "නැවිරු සවිය" නාවික සුවසහන අරමුදලෙහි අටවන වාර්ෂික මහා සභා රැස්වීම **2014** සැප්තැම්බර් මස **25** වන දින **1000** පැයට ශ්‍රීලංනානෞ පරාක්‍රම ආයතනයේ අද්මිරාල් සෝමතිලක දිසානායක ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

2. අරමුදලේ සභාපති වශයෙන් රියර් අද්මිරාල් ආර්සී විජේගුණරත්න, ඩබ්වී, ආර්ඩබ්පී*, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්එන් සහභාගි වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන අධ්‍යක්ෂ නාවික වෛද්‍ය සේවා, අධ්‍යක්ෂ නාවික අයවැය, අධ්‍යක්ෂ නාවික නීති සේවා, අධ්‍යක්ෂ නාවික සුභසාධක සහ වැ/බ අධ්‍යක්ෂ නාවික පරිපාලන යන නිලධාරින් සමග "නැවිරු සවිය" නාවික සුවසහන අරමුදලේ මූල්‍ය කළමණාකාරතුමන් ඇතුළු සාමාජික සාමාජිකාවන් **350** අධික සංඛ්‍යාවක් සහභාගී වූහ.

3. ප්‍රථමයෙන්ම "නැවිරු සවිය" අරමුදලේ සභාපති තුමන් විසින් පිලිගැනීමේ කථාව සිදු කරමින් එම අවස්ථාවට පැමිණ සිටි "නැවිරු සවිය" අධ්‍යක්ෂ මණ්ඩලය හා සහභාගිවූ සියළුම සාමාජිකයින් පිලිගත්තා ලදී. ඉන් අනතුරුව මූල්‍ය කළමණාකාර තුමන් විසින් පසුගිය ගිණුම් වර්ෂයේ "නැවිරු සවිය" අරමුදලේ වර්ධනය පිළිබඳව සමාලෝචනයක් සිදු කරන ලදි.

4. එම සමාලෝචනයෙන් පසුව "නැවිරු සවිය" ව්‍යවස්ථාවේ සදහන් ප්‍රතිලාභ ඉහළ නැංවීම් හා ව්‍යවස්ථා සංශෝධනයන් පිලිබඳ සභාවේ එකගතාවය ලබා ගැනීමේ අවස්ථාව උදා විය. එහිදි සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කෙටුම්පත් කරන ලද ව්‍යවස්ථා සංශෝධනයන් අධ්‍යක්ෂ නාවික නීති සේවා විසින් සභාවේ අනුමැතිය සදහා ඉදිරිපත් කරන ලදී.

5. ඒ අනුව **2014** සැප්තැම්බර් මස **25** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවස්ථා සංශෝධනයට සමගාමීව පහත සදහන් ප්‍රතිලාභයන් ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

- සාමාන්‍ය රෝග සදහා වූ වාර්ෂික ප්‍රතිපාදන සීමාව රු. 50,000.00 සිට රු. 75,000.00 දක්වා ඉහළ නැංවීම.
- සාමාන්‍ය රෝග සංඛ්‍යාව **56** සිට **63** දක්වා ඉහළ නැංවීම.
- ශල්‍ය කර්ම ආවරණය සදහා වූ වාර්ෂික ප්‍රතිපාදන සීමාව රු. 80,000.00 සිට රු. 120,000.00 ඉහළ නැංවීම.
- ශල්‍ය කර්ම සංඛ්‍යාව 488 සිට 492 දක්වා ඉහළ නැංවීම.
- බරපතල රෝග සංඛ්‍යාව 30 සිට 35 දක්වා ඉහළ නැංවීම.
- බරපතල රෝග සදහා වන්දි අයදුම් කිරීමට ලබා දී තිබූ මාසයක සහන කාල සීමාව මාස 06 දක්වා දීර්ඝ කිරීම.
- බාහිර රෝගී අංශ තුලින් සිදු කරනු ලබන තෝරා ගත් වෛද්‍ය පරීක්ෂණ 5 ක් සදහා රු. 25,000.00 වාර්ෂික ප්‍රතිපාදන සීමාවක් හදුන්වා දීම.

6. අනතුරුව "නැවිරු සවිය" නාවික සුවසහන අරමුදලේ සභාපති තුමන් විසින් අරමුදල මගින් හිමිවන ප්‍රතිලාභයන් ලබා ගන්නා ආකාරය පිලිබඳව දැනුවත් වී සිටීමේ වැදගත් කම පෙන්වාදුන් අතර මෙම අරමුදල අපගේ මෙන්ම අප පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන්නක් බැවින් මෙහි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි අවස්ථාවන් වලදී නියමිත පරිදි එම ප්‍රතිලාභයන් ලබා ගැනීමට කටයුතු කරන ලෙස පැමිණි සිටි සියළු දෙනා දැනුවත් කරන ලදී. එමෙන්ම මෙම අවස්ථාවේදී ගන්නා ලද තීරණ හා ලබාදුන් උපදෙස් අනෙකුත් සාමාජිකයින් හටද සන්නිවේදනය කරන ලෙස දන්වා සිටි අතර, පසුව "නැවිරු සවිය" නාවික සුවසහන අරමුදලේ මූල්‍ය කලමණාකාරතුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව පැවති තේ පැන් සංග්‍රහය අවසානයේ 1130 පැයට පමණ "නැවිරු සවිය" නාවික සුවසහන අරමුදලේ අටවන මහා සභා රැස්වීමේ කටයුතු නිමාවට පත්විය.